# ඇප බැඳුම්කරය

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් සංස්ථාපනය කරන ලද ස්වකීය ලියාපදිංචි ගත කාර්යාලය බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත අංක 234 හි පිහිටි (මෙහි මින් මතු කාර්යාංශය යයි සඳහන් කරනු ලබන) ශ්‍රීලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (එකී කාර්යාංශයේ අනුප්‍රාප්තිකයන් හා අද්මිනිස්ත්‍රාසිරුවන් ද ඇතුළත්ව) **පළමු වන පාර්ශවයට** ද,

සහ,

මෙම ඇප බැඳුම්කරයේ මතු ඇපකරු ලෙස හඳුන්වනු ලබන පහත සඳහන් තැනැත්තා **දෙවන පාර්ශවය** ලෙස ද හඳුන්වන, ..........................................................[1] ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ..................................................................[2] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................................................................................................................ ..................................................[3] ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං ...............................................[4]) හිමි............................................................................................................................................[5] යන දෙවන පාර්ශවයේ උරුමකාර, පොල්මා:කාර සහ අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර හෝ ලැබුම්කාර ආදීන් අනෙක් පක්ෂයට ද බැඳී පහත සඳහන් පොරොන්දු ගිවිසිලිවලට එකගව ...............................[6] දින බත්තරමුල්ලහිදී ස්ව කැමැත්තෙන් ඇතුලත් වන්නට යෙදුන ඇප බැඳුම්කරයේ වග නම් ;

1. මෙහි මින්මතු සේවා නියුක්තික යැයි කියනු ලබන ............................................................ ...................................................................................................................[7] ලිපිනයෙහි පදිංචි .......................................................................................................................................[8] (ජා.හැ.අං ..................................................[9]) යන අය ඊශ්‍රායලය රාජ්‍යයේ ..............................................................................................[10] ආයතනයෙහි මාස 63 කාලයක් සඳහා කෘෂිකාර්මික රැකියාවක (එම රැකියාව මින් මතු “විදේශ රැකියාව” ලෙසත් එකී ආයතනය සමග සේවා නියුක්තික අත්සන් කළ ගිවිසුම “ඊශ්‍රායල් රැකියා ගිවිසුම” ලෙසත් හැඳින්වේ.) සේවකයෙකු වශයෙන් සේවය කිරීමට ..................................[11] දින ගිවිසගෙන සිටින බවත් පළමු පාර්ශවය මගින් එම රැකියාව ලබා ගෙන ඇති බවත් සේවා නියුක්තික පළමු පාර්ශවය සමග ................................[12] දින එම විදේශ රැකියාව ලබාගැනීම සඳහා

බත්තරමුල්ලේ දී පළමු පාර්ශවය සමඟ ගිවිසුමකට (මින් මතු **"රැකියා ගිවිසුම"** ලෙස හඳුන්වනු ලබන) එළඹ ඇති බවත් මෙහි පාර්ශවයන් පිළිගනු ලබයි.

2. සේවා නියුක්තික රැකියා ගිවිසුම අනුව කටයුතු කිරීමට බැඳී ඇති බැවින් සහ එකී රැකියා ගිවිසුමෙහි කාර්යය සාධනයෙහිලා මෙන්ම එකී රැකියා ගිවිසුම යථා පරිදි ඉටු කිරීමට සේවා නියුක්තිකයාට ඇති වගකීම තහවුරු කරනු පිණිස ඇපකරුවන් වීමට ස්ව කැමැත්තෙන් දෙවන පාර්ශවය බන්ධදායකයන්ව ඇති බවට පාර්ශවයන් පිළිගනු ලබන බවට මෙම ඇප බැඳුම්කරය මගින් මෙසේ සාක්ෂි දරණ බව සියල්ලන් විසින්ම දැනගත යුතුය. මෙම ඇප බැඳුම්කරය සේවා නියුක්තිකයා විසින් සේවා ගිවිසුම දීර්ඝ කරගනු ලැබුවහොත් එසේ දීර්ඝ කරගනු ලබන අවසන් කාලය දක්වා වලංගුවන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

3. ඊශ්‍රායල් රැකියා ගිවිසුමට අනුව අදාළ කාල සීමාව සම්පූර්ණ කිරීමෙන් පසු හෝ ඊශ්‍රායල් රැකියා ගිවිසුමේ නියමයන් අනුව සේවය අවසන් කිරීමෙන් පසු සේවා නියුක්තිකයා වහාම ශ්‍රී ලංකාවට පැමිණිය යුතු අතර එසේ පැමිණ සති දෙකක කාලයක් ඇතුළත මෙහි පළමු පාර්ශවය වෙත වාර්තා කළ යුතුය. සේවා නියුක්තික විසින් ඊශ්‍රායල් රැකියා ගිවිසුමට අනුව ක්‍රියා කල යුතු අතර එකී ඊශ්‍රායල් රැකියා ගිවිසුම හෝ කාර්යාංශය සමග ඇතිකරගත් රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා නොකළ යුතුය.

4. සේවා නියුක්තිකයා වෙනුවෙන් ඇපකරුවන් වීමට දෙවනපාර්ශවය එකඟ වී ඇති බැවින් සේවා නියුක්තිකයා විසින් කාර්යාංශය සමග ඇතිකරගත් රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් ශ්‍රී ලංකා රුපියල් මිලියන පහක**(රු.5,000,000/-)** මුදලක් පළමු පාර්ශවය ඉල්ලා සිටි විටකදී පළමු පාර්ශවය වෙත ඉල්ලා සිටි දිනට එකවර නොපමාව ගෙවීම පිණිස දෙවන පාර්ශවය බන්ධනය වී ඇති බවත් එම ගෙවීම උදෙසා ඇපකරුගේ උරුමකරුවන් අද්මිනිස්ත්‍රාත්කරුවන් සහ පොල්ම:ක්කරුවන් වෙනුවෙන්ද මෙම ලියවිල්ල මගින් එක්ව සහ වෙන් වෙන්ව බන්ධනය වී සිටිනු බවත් දෙපාර්ශවය පිළිගනු ලබයි.

5. සේවා නියුක්තිකයා විසින් එකී රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් එකී ඇප මුදල වන රුපියල් මිලියන පහක **(රු.5,000,000/-)** මුදල ඇපකරුගෙන් පළමු පාර්ශවයට අයකර ගැනීමට සම්පූර්ණ නෛතික හිමිකමක් හා බලයක් ඇති බැව් දෙපාර්ශවය පිලිගනී.

6. මෙම ඇප බැඳුම්කරය සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය කඩුවෙල දිසා අධිකරණය විය යුතු බව දෙපාර්ශවය විසින් පිළිගනු ලැබේ.

7. මෙම බැඳුම්කරයේ කාර්යයන් වෙනුවෙන් සියළුම දැනුම්දීම් සඳහා දෙවන පාර්ශවයේ ඉහත දක්වා ඇති ලිපිනය ස්ථිර ලිපිනය ලෙස පිළිගනු ලබන අතර එම ලිපිනයට සිතාසි හා නොතිසි භාරදීම වලංගු හා නිසි භාරදීමක් බව දෙපාර්ශවය විසින් පිළිගනු ලබයි.

8 තවද ඇපකරු විසින් පිළිවලින් අයකර ගැනීමේ වාසිය සහ බෙදා ගෙවීමේ වාසිය (beneficium ordinis seu excussionis et divisionis) ද ඇපකරුගේ තත්වයෙන් නීතියෙන් ඇපකරුට හිමි වෙනත් සියළු වාසි, වරප්‍රසාද සහ ව්‍යතිරේකද මෙයින් අත්හැර දමයි. ඒ අත්හැර දැමීමේ බලපෑම් සහ බලාත්මකභාවය මට පැහැදිලි කරදෙන ලදි. එසේම ඒ කාරණය සම්බන්ධයෙන් මම පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවද මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

9. රැකියා ගිවිසුම කිසිම අවස්ථාවකදි සේවා නියුක්තිකයා විසින් උල්ලංඝනය කල හොත්, රැකියා ගිවිසුමට අනුව එකඟ වූ රැකියා ස්ථානය අතහැර ගියහොත්, ශ්‍රී ලංකාවේ කිර්ති නාමයට බලවත් හානියක් සිදුවන බවටත් පළමු පාර්ශවයේ මහජන සේවා කටයුතු සඳහා බලවත් අගතියක් සිදු වන බවටත් ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂකයින්ට අනාගතයේ දි විදේශ රැකියාවන් ලබාගැනිමේ දි අහිතකර තත්වයක් උද්ගත විය හැකි බවටත් රැකියා ගිවිසුම පදනම් වූ රැකියාවේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන පහක**(රු. 5,000,000/-)** මුදලක් වන බවටත් මනා අවබෝධයකින් යුතුව ස්ව කැමැත්තෙන් මෙහි ඇප කරුවකුව ඇති බවට දෙවන පාර්ශවය විසින් මෙයින් වැඩිදුරටත් පිළිගනු ලබයි.

ඉහත පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය ඉහත සියලු ප්‍රකාශයන්ට එකඟව වගකීම් මැනවින් අවබෝධ කරගත් බැවින් ඉහත සියලු ප්‍රකාශයන්ට නියමිත වගකීම් භාරගැනීම සඳහා බත්තරමුල්ලේ දී අත්සන් තබන ලදී.

**<u>පළමු පාර්ශවය</u>**

........................................................
තනතුර:- අතිරේක සාමාන්‍යාධිකාරී (දේශීය කටයුතු) / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රහුණු) /
කළමණාකරු (බදවාගැනීම් -සාමාන්‍ය ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**<u>දෙවන පාර්ශවය</u>**

......................................
**ඇපකරු (අත්සන)**

**<u>සාක්ෂි</u>**

1. ………………………………………………….……………................. ……...………

2. ………………………………………………….…………...……..... …….................
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) **(අත්සන)**

මෙම ඇප බැඳුම්කරයේ අඩංගු කරුණු මා විසින් මෙහි සඳහන් සියලු පාර්ශවයන්ට කියවා පැහැදිලි කර දුන් පසු එම කරුණු තේරුම්ගෙන මා ඉදිරියේ දී මෙම ලියවිල්ලට හා මෙම ලියවිල්ල හා සමාන පිටපතකටත් ඔවුනොවුන් විසින් වර්ෂ ................................. දින දී බත්තරමුල්ලේ දි අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

**නීතිඥ**